බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

පුරප්පාඩු

(කොන්ත්‍රාත් පදනම මත)

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද සහ බඳවා ගැනීමේ අනෙකුත් කොන්දේසි පිළිබඳ විස්තර, නියමිත අයදුම්පත් සමඟ, පහත සඳහන් කර ඇත.

නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අදාළ අයදුම්පත බාගත කර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **ලියාපදිංචි තැපෑලෙන්** පහත ලිපිනයට යොමු කළ යුතුය:

සභාපති, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, අංක. 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07

අයදුම්පත් ඉහත ලිපිනයට 2026 නොවැම්බර් 10 දින සිට රජයේ වැඩ කරන දින 14ක් ඇතුළත යොමු කළ යුතුය.

අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙන ම අයදුම්පත් යොමු කළ යුතුය.

පුරප්පාඩු තනතුරු

1	සහකාර සාමාන්‍යාධිකාරී - පාලන හා මානව සම්පත් (තනතුරු 01)
2	සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි, නිෂ්පාදන හා පර්යේෂණ (තනතුරු 01)
3	අභ්‍යන්තර විගණක (තනතුරු 01)
4	සැපයුම් හා වෙළඳාම් නිලධාරී (තනතුරු 01)
5	ගිණුම් නිලධාරී (ආදායම්) (තනතුරු 01)
6	ශබ්ද හා සංස්කරණ නිලධාරී (තනතුරු 01)
7	සංවර්ධන සහකාර (තනතුරු 02)
8	පරිගණක තාක්ෂණ ශිල්පී (තනතුරු 01)
9	කළමනාකරණ සහකාර (තාක්ෂණ) (තනතුරු 02)
10	කළමනාකරණ සහකාර (තනතුරු 07)
11	රියදුරු (තනතුරු 02)
12	චිත්‍රපට ප්‍රතිසංස්කරණ සහායක (තනතුරු 02)
13	කාර්යාල කාර්ය සහායක (තනතුරු 01)

සැලකිය යුතුයි:

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
අංක: 303, බෞද්ධාලෝක මාවත
කොළඹ 07

1 සහකාර සාමාන්‍යාධිකාරී - පාලන හා මානව සම්පත් (MM 1-1) (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද :-

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, වාණිජ හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

සමඟ

සුදුසුකම් ලබාගැනීමෙන් පසු, රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එකක (01) පළපුරුද්දක් ලබාතිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MM 1-1**

- රු. 81,710/=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාළ අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු: 22- 45

2 සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි, නිෂ්පාදන හා පර්යේෂණ (MM 1-1) (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද :-

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලන, අලෙවිකරණය, වාණිජ්‍යය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම

සමඟ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු , රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එකක (01) පළපුරුද්දක් ලබාතිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MM 1-1**

- රු. 81,710/=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාළ අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු: 22- 45

3 අභ්‍යන්තර විගණක (MM 1-1) (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද :-

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලන, වාණිජ්‍යය හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

සමඟ

සුදුසුකම් ලබාගැනීමෙන් පසු, රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එකක (01) පළපුරුද්දක් ලබාතිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MM 1-1**

- රු. 81,710/=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාළ අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු: 22- 45

4 සැපයුම් හා වෙළඳාම් නිලධාරී (JM 1-1) (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද :-

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සැපයුම්දාම කළමනාකරණය, ව්‍යාපාර පරිපාලන, අලෙවිකරණය, වාණිජ්‍යය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **JM 1-1**

- රු. 65,633/=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාළ අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු: 22- 45

5 ගිණුම් නිලධාරී (ආදායම්) (JM 1-1) (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද :-

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලන, වාණිජ්‍යය හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

දීමනාව :-කළමනාකරණ සේවා වක්‍ර ලේඛ අංක 01/2025 **JM 1-1**

- රු. 65,633/=
- වක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාළ අනෙකුත් දීමනා

වයස් සීමාව :- අවු: 22- 45

6 ශබ්ද හා සංස්කරණ නිලධාරී (JM 1-1) (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද :-

පහත 1 හෝ 2 හෝ 3 හෝ 4

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින්, ශබ්ද හා සංස්කරණය පිළිබඳව නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවනහි **(NVQ) හත්වැනි (07)** වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින්, ශබ්ද හා සංස්කරණය පිළිබඳව නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවනහි **(NVQ) හයවැනි (06)** වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සුදුසුකම් ලබාගැනීමෙන් පසු, රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ **වසර පහක (05)** පළපුරුද්දක් ලබාතිබීම.

4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින්, ශබ්ද හා සංස්කරණය පිළිබඳව නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවනහි **(NVQ) පස්වැනි (05)** වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ **වසර දහයක (10) ක** පළපුරුද්දක් ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා වක්‍ර ලේඛ අංක 01/2025 **JM 1-1**

- රු. 65,633/=
- වක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාළ අනෙකුත් දීමනා

වයස් සීමාව :- අවු: 22- 45

7 සංවර්ධන සහකාර (MA-3) (තනතුරු 02)

සුදුසුකම් හා පළපුරුද්ද :-

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා වක්‍ර ලේඛ අංක 01/2025 **MA3**

- රු. 49,831/=
- වක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව :- අවු: 22- 45

8 පරිගණක තාක්ෂණ ශිල්පී (MA 2-1) (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද :-

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවනහි **(NVQ)** පස් (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MA2-1**

- රු. 46,960 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු.18-45

9 කළමනාකරණ සහකාර (තාක්ෂණ) (MA 2-1) (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද :-

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවනහි **(NVQ)** පස් (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MA2-1**

- රු. 46,960 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු.18-45

10 කළමනාකරණ සහකාර (MA 1-1) (තනතුරු 07)

සුදුසුකම් හා පළපුරුද්ද :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන(03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **MA1-1**

- රු. 43,312 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු.18 – 45

11 රියදුරු (PL 3) (තනතුරු 02)

සුදුසුකම් හා පළපුරුද්ද :-

අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02)ක් සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම.

ප්‍රවීණතා

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **PL3**

- රු. 40,834 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු.18 -45

12 චිත්‍රපට ප්‍රතිසංස්කරණ සහායක (PL 2) (තනතුරු 02)

සුදුසුකම් හා පළපුරුද්ද :-

චිත්‍රපට ප්‍රතිසංස්කරණ කටයුතු වලට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව **(NVQ)** දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **PL2**

- රු. 40,008 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා .

වයස් සීමාව : – අවු.18 -45

13 කාර්යාල කාර්ය සහායක (PL 1) (තනතුරු 01)

සුදුසුකම් හා පළපුරුද්ද :-

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම.

දීමනාව :- කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 **PL1**

- රු. 38,488 /=
- චක්‍ර ලේඛණ ප්‍රකාරව කොන්ත්‍රාත් තනතුරට අදාල අනෙකුත් දීමනා

වයස් සීමාව : – අවු.18-45

තනතුරේ ස්වභාවය හා සේවා කොන්දේසි :-

මෙම බඳවාගැනීම් මූලික වශයෙන් වසර 01 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වේ. එමෙන්ම ලිත් මසක දැනුම් දීමකින් කොන්ත්‍රාත් කාල සීමාව අවසන් කිරීමට පත්වීම් බලධාරියාට හැකියාවක් ඇත. සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා දායක විය යුතුය.

බඳවාගැනීමේ ක්‍රමය :-

ලිඛිත තරඟ විභාගයක හා/හෝ පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

අයදුම්කරුවන් සඳහා කොන්දේසි

- අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- අයදුම්කරුවන් තනතුරේ රාජකාරී හොඳින් ඉටුකිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කිරීමට හැකියාව තිබිය යුතුය. (කෙසේ වෙතත් ඔබගේ නිත්‍ය සේවා ස්ථානය නො.303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 වේ.)
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත්‍රය සමඟ උප්පැන්න සහතිකයේ/අධ්‍යාපන/වෘත්තීය සහතික සහ සේවා සහතිකවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.
- මෙය කොන්ත්‍රාත් තනතුරකි. තෝරාගත් අපේක්ෂකයින් තම වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අමුදල සඳහා දායක විය යුතු අතර, ආයතනය සේවක අර්ථ සාධක අරමුදල සඳහා 12% ක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ක් දායක කරනු ඇත.
- මූලික වැටුප සහ කොන්ත්‍රාත් තනතුර සඳහා හිමි අනෙකුත් අනුමත දීමනා ආයතනය විසින් ගෙවනු ලැබේ.
- රජයේ /රාජ්‍ය සංස්ථා /මණ්ඩල/ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන්නෙකු නම් අදාළ ආයතන ප්‍රධානීගේ නිර්දේශ සහිතව අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

නියමිත සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද අසම්පූර්ණ සහ නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉහත පුරප්පාඩු පිරවීමේ අවසන් තීරණය ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
303, බෞද්ධාලෝක මාවත
කොළඹ 07